## iv පෞද්ගලික

මහ බැංකු අධිපති ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා ජපන් මහ බැංකුවේ අධිපතිගේ ඇරයුමක් පිළිගෙන තෝකියෝවේ පැවැත්වුනු 'සියැන්සා' මහ බැංකු අධිපති වරුන්ගේ සම්මේලනයට සහභාගිවීම සඳහා 1961 අප්‍රේල් මස 1 වැනි දින දිවයිනෙන් පිටත්වී ගියේය. අධිපති නැවත ලංකාවට පැමිණියේ 1961 අප්‍රේල් මස 19 වැනි දිනය. ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ සහ ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ අධිපති මණ්ඩලයේ වාර්ෂික සභා වාරවලට සහභාගිවීම සඳහා 1961 සැප්තැම්බර් මස 12 වැනි දින වියානාව බලා පිටත් වූ අධිපති 1961 ඔක්තෝබර් මස 3 වැනි දින නැවත ලංකාවට පැමිණියේය. පාකිස්ථාන රාජ්‍ය බැංකු අධිපතිගේ ඇරයුමක් පරිදි පාකිස්ථානයේ නිලගමනක යෙදීම සඳහා 1961 නොවැම්බර් මස 3 වැනි දින දිවයිනෙන් බැහැරව ගිය අධිපති නැවත ලංකාවට පැමිණියේ 1961 නොවැම්බර් මස 19 වැනි දිනය.

මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වූ ද මුදල් මණ්ඩලයට පත් කැරුණු රජයේ සාමාජිකයා වූ ද එස් එෆ් අමරසිංහ මහතාගෙන් (ඕ. බී. ඊ.) පසු 1961 ජූනි මස 1 වැනි දින සිට එම තනතුරට මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම් එච්. එස්. අමරසිංහ මහතා පත් කැරිණි:

අධිපති වරුන් ගේ සහකාර ඩී. සී. ගුණසේකර මහතා එක්සත් ජාතීන්ගේ සංගමයෙහි 16 වැනි සැසි වාරයට සහභාගි වන ලංකාවේ නියෝජිත මණ්ඩලයේ කෙනෙකු හැටියට අගමැතිණිය විසින් පත් කැරුනේ, එකී සැසි වාරයට සහභාගි වීම සඳහා 1961 සැප්තැම්බර් 15 වැනි දින නිව්යෝක් නගරය බලා පිටත් විය. ඔහු 1961 දෙසැම්බර් මස 30 වැනි දින නැවත ලංකාවට සැපත් විය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස වැඩ බැලූ ආචාර්ය ගාමිණී කොරෙයා 1961 ජනවාරි මස 1 වැනි දින සිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කැරිණි. ආසියාවේ සහ ඈත පෙරදිග ආර්ථික කොමිෂමේ (ආ. ඈ : ආ. කො.) ඉල්ලීම පරිදි ආචාර්ය ගාමිණී කොරෙයා 1961 නොවැම්බර් මස 20 වැනි දින සිට දෙසැම්බර් 15 වැනි දින තෙක් ඉන්දියාවේ ජායිපූර්හි පැවැත්වුණු ප්‍රාදේශීය සම්මේලනයේ ("වෙළෙඳාම නගා සිටුවීම") යන මැයෙන් පැවැත්වුණු සාකච්ඡාවට සහභාගි වූ අතර දෙසුම් පෙළක් ද පැවැත්වූයේය.